**පච්චිලෛයිපල්ලි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**
---------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 03 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 18 වන දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පච්චිලෛයිපල්ලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

අවස්ථා 01කදී රු.10,050 ක්වූ ආදායමක් මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දැක්වා තිබුණි.

1.3.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්
-----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | | නීති, රීති, රෙගුලාසි හා මුදල් රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය | |
| | (I) | V වන පරිච්ඡේදයෙහි රීති අංක 140 | 2016 වර්ෂයේදී ගෙවන ලද රු. 2,144,348 ක් වූ අත්තිකාරම් නියමිත කාල වකවානු වලදී අයකර ගැනීමට සභාව විසින් අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (II) | VIII වන පරිච්ඡේදයෙහි රීති අංක (i)178(3) | අනුමත ආයතන හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලේඛණයක් පිළියෙල කර නොතිබුණි. |
| (III) | IX වන පරිච්ඡේදයෙහි රීති අංක 180 | මුදල් හා ගබඩා කටයුතු භාර නිළධාරීන්ගෙන් ඇප අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | 1985 අංක 19 දරණ වැන්දඹු හා අනත්දරු පනත | සේවකයින්ගේ අයකරන ලද රු.16,080 ක් වූ මුදල් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදලට දායකවීම් විශ්‍රාම දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමකින් තොරව විවිධ තැන්පතු වල අවුරුදු 1 සිට 2 දක්වා තැන්පත් කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි අංක 571 | අයිතම 19 කට අදාල එකතුව රු.1,223,616 ක් වූ පොදු තැන්පතු වර්ෂ දෙකකට වැඩි කාලයක් නිරාකරණය කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 9,312,671 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 11,550,325 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලය රු.2,237,654 ක පහත බැසීමක් දක්නට ලැබුණි.

2.2 ආදායම් පරිපාලනය
---------------------

2.2.1 අයවැයගත ආදායම, තත්‍ය ආදායම හා හිඟහිටි ආදායම
-----------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 2016 වර්ෂයේ අයවැයගත ආදායම, තත්‍ය ආදායම හා හිඟහිටි ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් අයිතමය | අයවැයගත ආදායම | තත්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බදු කුලී | 6,256,696 | 4,128,681 | 194,541 |
| බලපත්‍ර ගාස්තු | 300,500 | 368,910 | 500 |
| අනෙකුත් ආදායම් | 41,762,645 | 36,151,963 | 4,655,844 |
| | 48,319,841 | 40,649,554 | 4,850,885 |

2.2.2 වරිපනම් හා බදු

------------------

1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයහි III පරිච්ඡේදයෙහි රීති අංක 32 ප්‍රකාරව සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වරිපනම් බදු සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණු අතර වරිපනම් බදු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

2.2.3 ලැබිය යුතු ගිණුම්

--------------------

ණයගැති ගිණුම් වල පෙන්නුම් කරන ලද රු. 2,216,718 ක් වටිනා ශේෂ අයිතම 9 ක් අදාල කාලපරිච්ඡේදය තුල අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණු අතර එය වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා වූ කාලපරිච්ඡේදයට ඇතුලත් ආදායම් ණයගැතියන්ගේ ශේෂය ලෙස ගිණුම් වල පෙන්වා තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

---------------

ඉඩම් රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් ලැබිය යුතු සභාවට අයත් මුද්දර ගාස්තු එකතුව වූ රු. 2,724,727 ක් වර්ෂ 1 සිට වර්ෂ 7 දක්වා කාලය තුල අයකර ගැනීමට සභාව විසින් වගකිව යුතු පියවරයන් කිසිවක් ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සභාව විසින් ලංකා බැංකුවෙහි තබා ඇති රු. 17,853 ක් වූ අංක C 2713 දරන ස්ථාවර තැන්පතුව වර්ෂ 07 කට වැඩි කාලයක් භාවිතා නොකර තිබෙන බව නිරීක්ෂණය විය.

3.2 සේවක පුරප්පාඩු

------------------

සභාව විසින් කම්කරු සේවක පුරප්පාඩු 11 ක් පිරවීමට කටයුතු කර නොතිබූ අතර ඒ හේතුවෙන් සභාවේ වැඩ කටයුතු වලට බාධා ඇතිව නැතැයි යන්න විගණනයෙන් බැහැර කළ නොහැකි විය.

3.3 හඳුනාගත් අලාභ

------------------

සභාව සතු රු. 5,190,000 ක් වටිනා සිංගල් කැබ් රථයක් 2015 ඔක්තොම්බර් 27 දින අනතුරකට පත්ව තිබූ අතර එය අළුත්වැඩියා කිරීම සඳහා රු.674,407 ක් වැයවී තිබුනි. ඉන් රු.526,587 ක් රක්ෂණ සමාගමින් ලැබී තිබුණු අතර, ඉතිරි රු.147,820 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. තවද ඒ පිළිබඳව මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව මූලික විමර්ෂණයක්ද සිදුකර නොතිබුණි.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය

---------------------------------

සභා බල ප්‍රදේශය තුල එකතු වන කුණු, ගිණි තබා විනාශ කිරීම හා පස් දමා වසා දැමීම ආදී කටයුතු පමණක් සභාව විසින් සිදුකරන අතර කොම්පෝස්ට් පොහොර සෑදීම හා නැවත භාවිතයට ගැනීම් යනාදී ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය කිරීමට සභාව විසින් කිසිදු පියවරයන් ගෙන නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

සභාවේ කටයුතු අභ්‍යන්තර විගණනයකට යටත් කර සභාව තුළ අභ්‍යන්තර පාලනයක් ඇති කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන ඒකකයක්ද ස්ථාපිත කර නොතිබුණි. ඒ හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් ප්‍රාදේශීය සභාව විසින් සිදුකර නොතිබුණි.

4.2 අයවැය පරිපාලනය

---------------------

නියමිත පරිදි අයවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම හේතුවෙන් අයවැයගත ආදායමත් තත්‍ය ආදායමත් අතර රු. 7,670,288 ක වෙනසක් දක්නට ලැබුණු අතර අයවැයගත වියදමත් තත්‍ය වියදමත් අතර රු. 9,488,348 ක වෙනසක් දක්නට ලැබුණි.

4.3 නොවිසඳුනු විගණන ඡේද

-----------------------------

2012 වර්ෂයේදී සභාව සතු කැබ් රථයක් සභාපතිවරයා විසින් තමන්ගේ පෞද්ගලික කටයුත්තක් සඳහා පිට දිස්ත්‍රික්කයකට එනම් වව්නියාව දිස්ත්‍රික්කය සඳහා රැගෙන ගොස් තිබූ අතර එය 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතට පටහැනිව සිදුකර තිබුණි. එම වාහනය සභාපතිවරයා විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා 2012 ජනවාරි 09 සිට ජුනි 25 දක්වා කිලෝමීටර් 7279 ක් ධාවනය කර තිබූ අතර ඒ වෙනුවෙන් භාවිතා කරන ලද ඩීසල් ලීටර් 921 ක් සඳහා සභාව විසින් රු.109,573 ක වියදමක් දරා තිබුණි. සිද්ධිය වාර්තා කර 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 04 ක වැඩි කාලයක් ගතවී ඇතත් ඒ සම්බන්ධයෙන් ඵලදායී පියවරක් ගැනීමට සභාව මෙතෙක් කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත දෑ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

i හිඟහිටි ආදායම් අයකර ගැනීම
ii වාහන භාවිතය
iii කොන්ත්‍රාත් පරිපාලනය
iv ආදායම් ගිණුම්ගත කිරීම
v කම්කරුවන් අධීක්ෂණය